සැකසුම - ඩබ්.එන්.ජී.චන්ද්‍රකාන්ති

ර/ නිවි/ ඇලපාත මහා විද්‍යාලය

**නිපුණතාව 2.0 - වාදනයේ මූලික හැකියා වර්ධනය කර ගනියි.**

**නිපුණතා මට්ටම 2 .1 -වාද්‍ය භාණ්ඩයන්හි ස්වරූපය වටහා ගනිමින් වාදන හැකියා ප්‍රදර්ශනය කරයි.**

**ක්‍රියාකාරකම 2.1.1 - සර්පිනාවේ ව්‍යුහය**

## සර්පිනාව (හාර්මෝනියම්)

***සර්පිනා වාද්‍ය භාණ්ඩය සංගීත ලෝකයේ සියලු ම භාණ්ඩ අතරින් ප්‍රමුඛස්ථානයක් ගන්නා වාද්‍යයකි. සෑම සංගීතඥයෙකු ම තම පරිශීලනය සඳහා සර්පිනාවක් භාවිත කිරීම සුලබ ලක්ෂණයක් වන අතර ලංකාවේ පැරණි ග්‍රැමෆෝන් ගී, නූර්ති, නාඩගම්, බජව් සඳහා වාදනය කළ එක ම සංගීත භාණ්ඩය ලෙස ද හැඳින්විය හැකිය. සර්පිනාව පිළිබඳ විග්‍රහයක් සහ සර්පිනා වාදනයක් සහිත මෙම වැඩසටහන් නැරඹීමෙන් ඔබේ දැනුම තව දුරටත් වර්ධනය කර ගත හැකි වේ.***

- https://youtu.be/bbRzLrZOwO8
- https://youtu.be/PU0bghXwl8M

**ඉහත 2.1.1 ක්‍රියාකාරකමට අදාළ ව සපයා ඇති අංක 01, 02 පැවරුම් සම්පූර්ණ කරන්න.**

පැවරුම- 01

1. ඉහත ආකාරයේ සර්පිනාව පිළිබඳ තොරතුරු ඇතුළත් වැඩසටහන් මෙන් ම සර්පිනා වාදන සහිත ගායන වාදන අංග ඔබට හැකි තාක් ශ්‍රවණය කරන්න. රසවිඳින්න. ඔබ ශ්‍රවණය කරන ලද ඊට අදාළ සංගීතාංග ලැයිස්තුගත කරන්න.

පැවරුම - 02

1. අන්තර්ජාලය ඔස්සේ සර්පිනාව පිළිබඳ තොරතුරු රැස් කරන්න. ඔබ රැස් කර ගන්නා තොරතුරු පහත සඳහන් ශීර්ෂ යටතේ ගොනු කොට දක්වන්න.

අතිරේක උදවු - **ස්වර පුවරු වාද්‍ය දීපනී** - විශාරද සුදත් සමරසිංහ

**ස්වර පුවරු සංගීත භාණ්ඩ වාදන ශිල්ප ක්‍රම** - ආර්.එම්.චන්ද්‍රසිරි රණසිංහ

| ***සර්පිනාවේ ව්‍යුහය/සර්පිනා වර්ග*** | ***සර්පිනාවේ ක්‍රියාකාරීත්වය*** | ***සර්පිනා වාදන ශිල්ප ක්‍රම*** | ***සර්පිනාවේ භාවිතය හා දක්ෂ වාදකයින්*** |
|---|---|---|---|